# පරිසරය

## 5 ශ්‍රේණිය



e තක්සලාව
The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa



# 13. පොළොව හා අහස

## ක්‍රියාකාරකම 11

- ශ්‍රී ලංකාවේ භූ විෂමතා දැක්වෙන සිතියමක් සපයා ගන්න. එහි කඳු, පහත් බිම්, ගංගා, දියඇලි ආදිය හඳුනාගන්න. ලෑල්ලක් මත හෝ සුදුසු ස්ථානයක මැටි පල්ප් වැනි දේ යොදා ගනිමින් ප්‍රදේශයේ භූ විෂමතාව දැක්වෙන ආකෘතියක් නිර්මාණය කරන්න.

## ක්‍රියාකාරකම 12

- තණකොළ සහිත හා තණකොළ රහිත ආනත හැඩයේ භූමියක් තෝරා ගන්න. විනිවිද පෙනෙන භාජන 2ක් තබා එයට සමාන ලෙස ජලය ගලායන ආකාරයට පීල්ලක් තබන්න. වැසි දිනක් අවසානයේ හෝ වතුර බටයකින් සමාන කාලයක් තුළ ජලය දමා රැස්වන ජල ප්‍රමාණය නිරීක්ෂණය කරන්න.

## ක්‍රියාකාරකම 13

- ගෙවත්තේ පස සෝදා ගොස් ඇති ස්ථානයක් තෝරා ගෙන තමා දන්නා උපක්‍රම එකක් හෝ කිහිපයක් යොදා එය වැළැක්වීමට ප්‍රායෝගිකව කටයුතු කරන්න.

  උදා:

  - තණකොළ වැවීම
  - ගල් යෙදීම
  - පැළ සිටුවීම
  - පොල් ලෙලි ඇල්ලීම

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සැකසුම: ජී.කේ සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය

Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 14

- ලෝක සිතියමක් සපයා ගන්න. එහි ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම නිරීක්ෂණය කරන්න. පහත සඳහන් දේවල් සොයා බලන්න.
    - ශ්‍රී ලංකාවට උතුරින් ඉන්දියාව
    - බටහිරින් අප්‍රිකානු රටවල්
    - දකුණින් ඉන්දියන් සාගරය
    - නැගෙනහිර මැලේසියාව හා තායිලන්තය
- ඉහත රටවල් සමඟ ඇති සම්බන්ධතාවය පිළිබඳව සොයා බලන්න.

## ක්‍රියාකාරකම 15

- ශ්‍රී ලංකාව වටා ඇති සාගරය අපට ප්‍රයෝජනවත් වන ආකාරය ගැන තොරතුරු සොයා බලන්න. වැඩිදුර තොරතුරු සොයා ගැනීමට පින්තූර, වීඩියෝ සහ හැකිනම් අන්තර්ජාලය භාවිතා කරන්න. (වැඩිහිටියෙකුගේ උදව් ඇතිව)

## ක්‍රියාකාරකම 16

- සුළගේ ශක්තිය උපයෝගී කර ගන්නා විවිධ අවස්ථා සොයා බලන්න. සුළඟින් ලබා ගන්නා ප්‍රයෝජන සහ සුළඟ නිපදවිය හැකි විවිධ ඇටවුම් නිර්මාණය කරන්න.
    - උදා: සුළං පෙත්ත

## ක්‍රියාකාරකම 17

- මාසේ පෝය දින සිට දින 7ක් පමණ රාත්‍රී කාලයේ එකම ස්ථානයේ සිට සඳේ පිහිටීම නිරීක්ෂණය කර අඳින්න.
    - උදා:

| දිනය | සඳ දැකිය හැකි දිශාව | හැඩය |
|---|---|---|
| 2020.11.23 | බස්නාහිර |  |


Copyright© www.e-thaksalawa.moe.gov.lk



## ක්‍රියාකාරකම 18

- පැහැදිලි රාත්‍රී අහසක් ඇති කාල වකවානුවක අහසේ දැකිය හැකි තරු රටා නිරීක්ෂණය කර හඳුනාගන්න. එම තරු රටා අඳින්න.
    - උදා: දඩයක්කාරයා, මහ වලසා

## ක්‍රියාකාරකම 19

- පොළොවේ සහ අහසේ අසිරිය ගැන කියවෙන කවි, ගීත සොයා ඒවා ගායනා කරන්න. රස විඳින්න.
    - සමන් පිච්ච මල් ඉහිරුණු-නිල් තණකොළ පිට්ටනියක්
      (එස් මහින්ද හිමි)
    - හඳපානේ වැලිතලා- සුර කුමරියෝ මල් සලා
      (කුමාරතුංග මුනිදාස)
    - මොනවද අම්මේ අකුරු ජාතියක්
      (සී.චන්ද්‍රරත්න මානවසිංහ)

අන්තර්ගතය: වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම: ජී.කේ් සත්‍ය ධනංජය ජයරත්න—හ/ වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය—වීරකැටිය
Copyright© www.e-thaksalawa.moe.gov.lk